# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2045/16 – 2017 නොවැම්බර් 15 වැනි බදාදා – 2017.11.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/J/2015/31.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එම්. සුනිල් මයා, මහගොඩවත්ත, දොරපෙ, අඟුළුගහ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා

1A – G 26589 – 22 (2017/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරු වශයෙන්, පිළියන්දල, නාම්පමුණුව, කුමුදු මාවත, අංක 89 එෆ්, සුනෙත් ලොකුබෝගහවත්ත මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය.

2017 නොවැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/J/2015/31.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එම්. සුනිල් මයා, මහගොඩවත්ත, දොරපෙ, අඟුළුගහ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයකු වූ එම්. සුනිල් මහතා වෛද්‍ය නිර්දේශය මත විශ්‍රාම ගැන්වීමේදී ඔහුට වන්දි මුදල් නොගෙවීම හා වෛද්‍ය නිර්දේශය මත ඔහු ලබාගත් නිවාඩු සඳහා අඩ වැටුප් නොගෙවීම යුක්තිසහගතද? එසේ නොවේ නම් එම්. සුනිල් මහතාට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ."

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 ඔක්තෝබර් මස 14 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

11 - 1313

---

මගේ අංකය: IR/COM/02/2017/182.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එක්සත් තේ, රබර් සහ මෙරට ද්‍රව්‍ය කම්කරු සමිතිය, අංක 513 - 2/1, ඇල්විටිගල මාවත, කොළඹ 05. (සේවකයන් 18 දෙනෙකු වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ෆින්ලේස් කලම්බු ලිමිටඩ්, අංක 186, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාතලේ, මෙල්පිටිය, අංක 75, එස්. කාරියවසම් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය.

2017 නොවැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2017/182.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එක්සත් තේ, රබර් සහ මෙරට ද්‍රව්‍ය කම්කරු සමිතිය, අංක 513 - 2/1, ඇල්විටිගල මාවත, කොළඹ 05. (සේවකයන් 18 දෙනෙකු වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ෆින්ලේස් කලම්බු ලිමිටඩ්, අංක 186, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ෆින්ලේස් කලම්බු ලිමිටඩ් ආයතනයේ සේවය කළ පහත නම් සඳහන් සේවකයින් 18 දෙනාගේ සේවය ආයතනය විසින් විනය කරුණු මත අවසන් කිරීමෙන් ඔවුන් 18 දෙනාට අසාධාරණයක් සිදු වී තිබේ ද? එසේ සිදුව තිබේ නම් ඔවුන්ට හිමි සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ.''

01. ජී. වේලායුදන්
02. ඩබ්. ජී. බී. කමල් ජයසේන
03. ඩී. එම්. තීක්ෂණ
04. කේ. ඒ. නිමලසිරි
05. එන්. බාලසුබ්‍රමනියම්
06. සරත් ගුරුගේ
07. ආර්. ආර්. පත්මසිරි
08. ජේ. එස්. ජේ. ප්‍රනාන්දු
09. ආර්. සී. ඩබ්. කේ. සිල්වා
10. එස්. ආර්. රොසයිරෝ
11. ඩබ්. එම්. විජිත විජේසිංහ
12. ඊ. ඩී. සුමිත් රණසිංහ
13. එස්. වික්‍රමසිංහ
14. ජේ. එම්. ඩී. එන්. ප්‍රියංකර
15. එල්. ඩී. සී. එන්. කුමාර
16. පී. බී. එස්. ගුණරත්න
17. ආර්. ඩී. දමින්ද
18. මෙලන් ෆ්‍රැන්සිස්

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 ඔක්තෝබර් මස 30 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

11 – 1314

මගේ අංකය: IR/COM/03/P/2015/188.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2017.06.16 වැනි දින අංක 2023/56 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2017.06.09 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

වයි. එම්. පුංචිබණ්ඩා මයා, අංක 155/2, මාංගොඩ, මැද මහනුවර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර පවත්නා 2017.03.27 වැනි දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පී. නවරත්න මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2017.06.09 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය.

2017 නොවැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

11 – 1315/1

---

මගේ අංකය: IR/COM/03/P/2015/188.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

වයි. එම්. පුංචිබණ්ඩා මයා, අංක 155/2, මාංගොඩ, මැද මහනුවර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන

කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, දිවුලපිටිය, මාපලන්ගෙදර, අංක 160, කේ. එම්. සරත්චන්ද්‍ර මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය.

2017 නොවැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/P/2015/188.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

වයි. එම්. පුංචිබණ්ඩා මයා, අංක 155/2, මාංගොඩ, මැද මහනුවර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ –**

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ තෙල්දෙණිය ඩිපෝවේ බස් රථ රියදුරෙකු ලෙස සේවය කර ඇති වයි. එම්. පුංචිබණ්ඩා මහතාගේ සේවය, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ශ්‍රීලංගම/මාසක/කම්.සබ/පොදු/2015 හා 2015.10.01 දිනැති ලිපිය මගින් ඔහුගේ සේවය තාවකාලිකව නතර කර ඇති 2008.02.23. දින සිට අවසන් කිරීම තුළින් ඒ මහතාට අසාධාරණයක් සිදුවී ඇත්ද යන්න සහ එසේ අසාධාරණයක් සිදු වී ඇත්නම් කවර සහනයන් ඔහු වෙත ලැබිය යුතු ද යන්නත් පිළිබඳව වේ.''

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 ඔක්තෝබර් මස 14 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

11 – 1315/2

---

මගේ අංකය: IR/COM/02/2016/127.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. සී. එම්. ඩී. අමරවර්ධන මයා, අංක 407 ඩී, බටපොත පරණ පාර, අකුරේගොඩ, බත්තරමුල්ල.

2. ආර්. ඒ. ආර්. රූපසිංහ මයා, අංක 62/8 ඒ, අලකේෂ්වර පාර, ඇතුල්කෝට්ටේ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සෙලාන් බැන්ක් පීඑල්සී, සෙලාන් ටවර්, අංක 90, ගාලු පාර, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, පන්නිපිටිය පාර, අංක 77, ටී. පියසෝම මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය.

2017 නොවැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

---

මගේ අංකය: IR/COM/02/2016/127.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. සී. එම්. ඩී. අමරවර්ධන මයා, අංක 407 ඩී, බටපොත පරණ පාර, අකුරේගොඩ, බත්තරමුල්ල.

2. ආර්. ඒ. ආර්. රූපසිංහ මයා, අංක 62/8 ඒ, අලකේෂ්වර පාර, ඇතුල්කෝට්ටේ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සෙලාන් බැන්ක් පීඑල්සී, සෙලාන් ටවර්, අංක 90, ගාලු පාර, කොළඹ 03.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''සෙලාන් බැන්ක් පීඑල්සී හි සේවය කරන ලද සී. එම්. ඩී. අමරවර්ධන මහතා සහ ආර්. ඒ. ආර්. රූපසිංහ මහතා පිළිවෙලින් 2009.12.06 දින සහ 2011.10.05 දින විශ්‍රාම ගැන්වීම යුක්තිසහගත වන්නේද යන්න හා යුක්තිසහගත නොවන්නේ නම් ඔවුන් එකිනෙකාට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 ඔක්තෝබර් මස 03 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

11 - 1316

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.